රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 09/98

මගේ අංකය : IV/2/9/156/6/39(එච්)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

1998.04.28 දින

සියළුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානින් වෙත.

**එක් භාෂාවකට වැඩි භාෂා ගණනක ප්‍රවීණතාවය ඇති රාජ්‍ය**
**<u>නිලධාරීන්ට දිරි දීමනා සහ වැටුප් වර්ධක</u>**

01. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV පරිච්ඡේදයේ 18(1) (2) (3) (4) සහ 25 වන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කෙරේ.

**02. හැඳින්වීම.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වගන්තිය අනුව සිංහල භාෂාව, රාජ්‍ය භාෂාව වන අතර දෙමළ භාෂාවද රාජ්‍ය භාෂාවක් වීමත්, ඉංග්‍රීසි භාෂාව සම්බන්ධීකරණ භාෂාව වීමත් සැලකිල්ලට ගන්නා කල දෙවැනි හා තෙවැනි භාෂාවක ලබන ප්‍රවීණතාවය තුළින් රාජ්‍ය සේවය ඵලදායී කිරීම සඳහා දිරිදීමනාවක් ලබා දීම අවශ්‍යය යන පදනම මත මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02.1. භාෂා ප්‍රවීණතාවය සඳහා දිරි ගැන්වීමේ ක්‍රම හඳුන්වා දෙන ලද 1989.07.31 හා අංක 38/89, 1990.03.12 දනම දරණ 38/89(I), 1991.04.24 දිනැති අංක 38/89(II) හා 1995.10.09 දිනැති අංක 38/89(III) චක්‍රලේඛ අවලංගු කර ඒ වෙනුවට මෙම චක්‍රලේඛය නිකුත් කරන අතර 1998.03.11 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

02.2. ඉහත 2.1 ඡේදයේ සඳහන් චක්‍රලේඛ අනුව දැනටමත් දිරි දීමනා ගෙවනු ලබන නිලධාරියකු මෙම චක්‍රලේඛය අනුව තවදුරටත් සුදුසුකම් ලබන්නේ නම් පමණක් එම නිලධාරීන්ට මෙම චක්‍රලේඛයට අනුව දිරිදීමනා ගෙවිය හැකිය.

02.3 කලින් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් නිසි අයුරින් අනුගමනය නොකිරීම නිසා හෝ සාවද්‍ය ලෙස අර්ථකථනය කිරීම මඟින් හෝ කිසියම් නිලධාරියකු දැනටමත් මෙම දිරි දීමනා ලබන්නේ නම් මෙම චක්‍රලේඛ උපදෙස් පදනම් කරගෙන එවැනි අවස්ථාවන් නිවැරදි කිරීමට ක්‍රියා කළ යුතුය.

02.4 මෙම චක්‍රලේඛයේ දිරි ගැන්වීමේ දීමනාව සඳහා පළමු භාෂාව යනු නිලධාරියෙකු තම වර්තමාන තනතුරට / සේවයට පත් වූ භාෂා මාධ්‍යයයි.

***උදාහරණ :*** නිලධාරියා සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබුවද ඉංග්‍රීසි මාධ්‍යයෙන් රාජ්‍ය සේවයට ඇතුලත් වීමේ විභාගයට පෙනී සිට සේවයට ඇතුලත් වූයේ නම් ඔහුගේ පළමු භාෂාව ඉංග්‍රීසි භාෂාව වන අතර සිංහල හා දෙමළ භාෂා පිළිවෙලින් ඔහුගේ දෙවන හා තෙවන භාෂා වශයෙන් සැලකිය හැකිය.

02.5 බඳවා ගැනීමේ පරිපාටිය හෝ සේවා ව්‍යවස්ථාව අනුව තනතුරට / සේවයට පත් කිරීම සඳහා අදාල වන භාෂා මාධ්‍ය පැහැදිලි නොවන අවස්ථාකදී මෙම දීමනාව ගෙවීම සඳහා නිලධාරියා ද්විතියක අධ්‍යාපනය හෝ තෘතීය / උසස් / අධ්‍යාපනය හෝ වෘත්තීය සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍ය පළමු භාෂා මාධ්‍යය ලෙස සැලකිය යුතුයි.

02.6 දෙවැනි භාෂාවකද තෙවැනි භාෂාවකද, දක්වන ප්‍රවීණතාවය සඳහා ලබා ගත හැකි මෙම දීමනාව, බඳවා ගැනීමේදී අවශ්‍ය කරන මූලික සුදුසුකම් අනුව දෙයාකාර වේ.

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය හෝ ඊට පහළ සහතිකයක් රජයේ සේවයට ඇතුළුවීම සඳහා වූ මූලික අධ්‍යාපන සුදුසුකම වන සේවයක නිලධාරීන්ට දෙනු ලබන දිරි දීමනාව

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ ) සහතිකය හෝ ඊට වඩා ඉහළ සහතිකයක් රජයේ සේවයට ඇතුළු වීම සඳහා වූ මූලික අධ්‍යාපන සුදුසුකම් වන සේවයක නිලධාරීන්ට දෙනු ලබන දීමනාව.

**<u>03. දීමනාව ලබා ගැනීමේ සුදුසුකම් :-</u>**

***03.1 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහතිකය හෝ ඊට පහළ සහතිකයක් රජයේ සේවයට ඇතුලුවීම සඳහා වූ මූලික සුදුසුකම් වන සේවයක නිලධාරීන්ට දෙනු ලබන දීමනාව ගෙවිය හැක්කේ පහත සඳහන් 3.1.1.(අ) සමඟ 3.1.1(ආ) යන කොන්දේසි දෙකම සපුරා ඇත්නම් පමණි.***

03.1.1.(අ) 1. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ හෝ ලබන

I. ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ
II. ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය හෝ
III. අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය හෝ
IV. ලන්ඩන් (සාමාන්‍ය පෙළ) විභාගවලින් අදාල භාෂාව විෂයය සඳහා සාමාර්ථය ලැබීම හෝ

2. පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන පනතේ විධිවිධාන අනුව උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වූ උසස් අධ්‍යාපන ආයතනයක් මඟින් පවත්වන ලද භාෂාව පිළිබඳ වෘත්තීය සහතිකයක් හෝ

3. ආයතන අධ්‍යක්ෂ විසින් පිළිගනු ලබන වෙනත් සහතිකයක්

3.1.1.(ආ) ආයතන අධ්‍යක්ෂ වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණය සමත් විය යුතුය.

3.1.1.(ආ)(1) වෛකල්පිත සිංහල / දෙමළ / ඉංග්‍රීසි විෂය සමත්වීම වෙනුවෙන් මෙම දීමනාවන් නොගෙවිය යුතුය.

3.1.1(ඇ) පහත දහන් අවස්ථාවන්හිදී වාචික පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කළ හැක.

I. දිරිදීමනාවක් ඉල්ලා සිටිනු ලබන දෙවන හෝ තෙවන භාෂාව අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් හෝ ඊට ඉහළ විභාගයකින් සමත්වී ඇති බව ඔප්පු කර ඇති විටකදී, සම කරනු ලබන වෙනත් විභාගයකට හෝ විශේෂිත පරීක්ෂණයකට පෙනී සිට සමත් වී ඇති නම්, හෝ

II. දිරි දීමනාව ඉල්ලා සිටිනු ලබන දෙවන හෝ තෙවන භාෂාව විෂයයක් ලෙස සමත් වූ අවස්ථාවක එම භාෂා මාධ්‍යයෙන්ම අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් නියමිත සියලුම විෂයයක් සමත් වී ඇත්නම් හෝ

III. දිරිදීමනා ඉල්ලා සිටිනු ලබන දෙවන හෝ තෙවන භාෂාව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත් වී ඇති විටක එම භාෂාව ඔහුගේ මව් භාෂාවද වන්නේ නම් හෝ

IV. ඉහත 3.1.1 යටතේ පවත්වනු ලබන ලිඛිත විභාගයකදී විභාගයේ කොටසක් ලෙස වාචික පරීක්ෂණයක් පවත්වා ඇති විට එම පරීක්ෂණයෙන් සමත් වී ඇත්නම් හෝ

V. ඉහත සඳහන් 3.1.1 හී සඳහන් ලිඛිත පරීක්ෂණයකින් සමත්වී ඇති අවස්ථාවක දෙවන හෝ තෙවන භාෂාවෙන් ලිඛිතව හා වාචිකව අදහස් ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් ප්‍රවීණතාවයක් ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය මත අදාල අමාත්‍යාංශයේ ලේකම් විසින් ආයතන අධ්‍යක්ෂගේ එකගත්වය ලබා ගෙන ඇත්තේ නම් හෝ

03.1.2 ඉහත 3.1.1 යටතේ සුදුසුකම් ලබාගන්නේ නම්, එක් භාෂාවකට රු. 150/- ක උපරිමයකට යටත්ව භාෂා දෙකටම මසකට රු. 300/- ක විශ්‍රාම වැටුප් රහිත මාසික දීමනාවක් ගෙවිය හැකිය.

03.1.3 ඉහත 3.1.1 හි සඳහන් විභාගයකින් දෙවන හෝ තෙවන භාෂා ප්‍රවීණතාවය සම්මාන සාමාර්ථයක් සහිතව ලබාගත් නිලධාරියකුට 3.1.2 හි සඳහන් දීමනාව මෙන් දෙගුණයක් හා සමාන විශ්‍රාම වැටුප් රහිත මාසික දීමනාවක් ද එක් වරක් පමණක් ගෙවන රු. 500/- ක ප්‍රසාද මුදලක්ද,

03.1.4 ඉහත 3.1.1 හි සඳහන් විභාගයකින් දෙවන හෝ තෙවන භාෂා ප්‍රවීණතාව විශිෂ්ඨ සම්මාන සාමාර්ථයක් සහිතව ලබා ගත් නිලධාරියකුට 3.1.2 හි සඳහන් දීමනාව මෙන් දෙගුණයක් හා සමාන විශ්‍රාම වැටුප් රහිත මාසික දීමනාවක් ද එක් වරක් පමණක් ගෙවන රු. 1000/-ක ප්‍රසාද මුදලක් ද ගෙවිය හැකිය.

03.1.5 මුල් අවස්ථාවේදී සාමාන්‍ය සාමාර්ථයක් ලබා දිරිදීමනාව ලැබීමට සුදුසුකම් ලැබූ නිලධාරියෙකු පසුව සම්මාන සාමාර්ථයක් හෝ විශිෂ්ඨ සාමාර්ථයක් ලැබුව හොත් ඊට අනුරූපව 3.1.3 හෝ 3.1.4 යටතේ හිමිකම් ලබන ප්‍රතිලාභ එම විභාගය සමත් වූ දිනයේ සිට ලැබීමට සුදුසුකම් ලබන අතර, එක් වරක් පමණක් ගෙවනු ලබන ප්‍රසාද මුදල් ගෙවීමේදී එසේ ගෙවිය යුතු වන්නේ පසුව හිමිකම් ලැබූ ප්‍රසාද දීමනාව හා කලින් ගෙවන ලද ප්‍රසාද දීමනාව අතර වෙනස පමණි.

03.1.6 යතුරුලේඛකයින් හා ලඝුලේඛකයින්ට දීමනා ගෙවීම සඳහා සලකා බැලීමේදී තමා දිරිදීමනාව ඉල්ලා සිටිනු ලබන භාෂා මාධ්‍යයෙන් 3.1.1 යටතේ දැක්වෙන විභාගයකින් යතුරුලියනය හෝ ලඝුලේඛණය සමත්ව සහතිකයක් ලබා තිබිය යුතුය.

***03.2 අ.පො.ස. (උසස් පෙළ) සහතිකය හෝ ඊට ඉහළ මට්ටමේ සහතිකයක් රජයේ සේවයට ඇතුලුවීම සඳහා වූ මූලික අධ්‍යාපන සුදුසුකම වන සේවයක නිලධාරීන්ට දෙනු ලබන දීමනාව.***

03.2.1 1. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබූ හෝ ලබන

I. උසස් පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ
II. විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගය හෝ
III. අ.පො.ස. (උසස් පෙළ) විභාගය හෝ
IV. ලන්ඩන් විශ්ව විද්‍යාලයේ අ.පො.ස. උසස් පෙළ විභාගය හෝ

2. පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන පනතේ විධිවිධාන අනුව උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වූ උසස් අධ්‍යාපන ආයතනයක හෝ පවත්වන ලද භාෂාව පිළිබඳ ඩිප්ලෝමාවක් ඇත්නම් හෝ

3. පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන පනතේ විධිවිධාන අනුව උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ලියාපදිංචි වූ උසස් අධ්‍යාපන ආයතනයක පවත්වන ලද සාමාන්‍ය උපාධි පරීක්ෂණයකදී හෝ විශේෂ උපාධි පරීක්ෂණයකදී හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණයකින් හෝ පශ්චාත් උපාධි පරීක්ෂණයකින් හෝ දිරි දීමනා ඉල්ලා සිටින දෙවන හෝ තෙවන භාෂාව සමත්ව ඇත්නම් හෝ

4. දිරිදීමනාවක් ඉල්ලා සිටින දෙවන හෝ තෙවන භාෂා මාධ්‍යයෙන් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් උපාධියක් හෝ හදරා සාර්ථකව සම්පූර්ණ කර ඇත්නම් හෝ

5. ආයතන අධ්‍යක්ෂ විසින් පිළිගනු ලබන වෙනත් සමාන සහතිකයක් මත හෝ මේ දීමනාව දිය හැකිය.

03.2.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ ) මට්ටමේ දෙවැනි භාෂාවක හෝ තෙවැනි භාෂාවක හෝ ඒ දෙකෙහිම ප්‍රවීණතාව සම්පූර්ණ කරන නිලධාරීන්ට එක් භාෂාවක මසකට රු. 150/- ක උපරිමයකට යටත්ව භාෂා දෙකටම රු. 300/- ක විශ්‍රාම වැටුප් රහිතව මාසික දීමනාවක් ලැබිය හැකිය.

03.2.3 ඉහත 3.2.1 හි සඳහන් විභාගයකින් දෙවන හෝ තෙවන භාෂා ප්‍රවීණතාව සම්මාන සාමාර්ථයක් සහිතව ලබා ඇත්නම් 3.2.2 හි සඳහන් දීමනාව මෙන් දෙගුණයක් හා සමාන විශ්‍රාම වැටුප් රහිත මාසික දීමනාවක් ද එක් වරක් පමණක් ගෙවන රු. 1500/- ක ප්‍රසාද මුදලක්ද,

03.2.4 ඉහත සඳහන් විභාගයකින් දෙවන හෝ තෙවන භාෂා ප්‍රවීණතාවය විශිෂ්ඨ සම්මාන සාමාර්ථයක් සහිතව ලබා ඇත්නම් 3.2.2 හි සඳහන් දීමනාව මෙන් දෙගුණයක් හා සමාන විශ්‍රාම වැටුප් රහිත මාසික දීමනාවක් ද එක් වරක් පමණක් ගෙවන රු. 2000/- ක ප්‍රසාද මුදලක්ද,

03.2.5 දිරිදීමනාව ඉල්ලා සිටිනු ලබන දෙවන හෝ තෙවන භාෂාව සාමාන්‍ය ශාස්ත්‍රවේදී හෝ ඊට ඉහළ මට්ටමේ විභාගයකින් විෂයක් ලෙස හදරා සමත්ව ප්‍රවීණතාවය ඔප්පු කරන්නේ නම් ඔහුට 3.2.2 හි සඳහන් දීමනාව මෙන් දෙගුණයක් හා සමාන විශ්‍රාම වැටුප් වැටුප් රහිත මාසික දීමනාවක් ද රු. 5000/- ක එකවර දෙනු ලබන ප්‍රසාද මුදලක් ද ගෙවිය හැකිය.

03.2.6 මුල් අවස්ථාවේදී සාමාන්‍ය සාමාර්ථයක් ලබා දිරිදීමනාව ලැබීමට සුදුසුකම් ලැබූ නිලධාරියෙකු පසුව සම්මාන සාමාර්ථයක් හෝ විශිෂ්ඨ සාමාර්ථයක් හෝ සාමාන්‍ය ශාස්ත්‍රවේදී හෝ ඊට ඉහළ මට්ටමේ සාමාර්ථයක් හෝ ලැබුව හොත් ඊට අනුරූපව ඉහත 3.2.3, 3.2.4 හෝ 3.2.5 යටතේ හිමිකම් ලබන ප්‍රතිලාභ එම විභාගය සමත් වූ දිනයේ සිට ලැබීමට සුදුසුකම් ලබන අතර, එක් වරක් පමණක් ගෙවනු ලබන ප්‍රසාද මුදල් ගෙවීමේදී එසේ ගෙවිය යුත්තේ පසුව හිමිකම් ලැබූ ප්‍රසාද මුදල් දීමනාව හා කලින් ලැබූ ප්‍රසාද මුදල් දීමනාව අතර වෙනස පමණි.

## 04. අනෙකුත් කොන්දේසි :

04.1 බඳවා ගැනීමේ පරිපාටියේ හෝ සේවා ව්‍යවස්ථාව අනුව හෝ කිසියම් නිලධාරියෙකු සේවයට ඇතුලත් වීමේදී හෝ සේවයට ඇතුලත් වීමෙන් පසුව හෝ කිසියම් භාෂාවක ප්‍රවීණතාව ලබා ගත යුතු යැයි නියම කර ඇති විටක (උද. මාණ්ඩලික නිලධාරීන් භාෂා පරිවර්තකයින් ) එම නියමයන් සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රවීණතා සහතිකය මෙම චක්‍රලේඛයේ සඳහන් දිරිදීමනාව ලබා ගැනීම සඳහා අදාල වන්නේ නැත.

**සටහන : එසේ වුවද**

(අ) භාෂා පරිවර්තක සේවයේ නිලධාරීන්ට තමා සේවය කිරීමට බැඳී ඇති භාෂා දෙක හැර වෙනත් අනුමත භාෂාවකින් ප්‍රවීණතාව දක්වන්නේ නම් ඒ සඳහා ද

(ආ)රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවයෙන් හෝ දෙවැනි භාෂා අවශ්‍යතාවයෙන් හෝ නිදහස් වීම සඳහා ඉදිරිපත් කරන ලද සහතිකය, ඉල්ලා සිටිනු ලබන භාෂා ප්‍රවීණතාව මට්ටමේ විභාගයකට වඩා ඉහළ මට්ටමකින් යුක්ත වන විභාගයකින් සුදුසුකම් ලබන අවස්ථාවක එම ඉහළ මට්ටම සඳහා ද මෙම දිරිදීමනාව ගෙවිය හැකිය.

**උදහරණ :** ප්‍රවීණතාව සනාථ කිරීම සඳහා අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයට සාමාන්‍ය සාමාර්ථයක් අවශ්‍ය වූ අවස්ථාවකදී යම් නිලධාරියකු අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වී ඇති බවට සහතිකයක් ඉදිරිපත් කරන්නේ නම්, රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවයෙන් හෝ දෙවන භාෂා අවශ්‍යතාවයෙන් නිදහස් වන අතරම අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත්වීම නිසා හිමිකම් ලබන දිරිදීමනා ලැබීමට එය එම නිලධාරියාට බාධාවක් නොවේ. එහෙත් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයට සාමාන්‍ය සාමාර්ථක් අවශ්‍ය අවස්ථාකදී ඔහු ඉදිරිපත් කරන අ.පො.ස. සාමාන්‍ය පෙළ සහතිකය සම්මාන සාමාර්ථයකින් හෝ විශිෂ්ඨ සම්මාන සාමාර්ථයකින් යුක්ත වුවද එම සහතිකය අනුව සම්මාන සාමාර්ථයක් හෝ විශිෂ්ඨ සම්මාන සාමාර්ථයක් සඳහා පමණක් දීමනා ලබා ගැනීමට ඔහු සුදුසුකම් නොලබයි.

04.2 බඳවා ගැනීමේ පරිපාටිය අනුව හෝ බඳවාගැනීම සඳහා ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීමේ අමතර භාෂාවක අවශ්‍යතාවය විශේෂ සුදුසුකමක් ලෙස සලකන අවස්ථාවන්හිදී එම භාෂාව දෙවන භාෂාව හෝ තෙවන භාෂාව වශයෙන් සලකා මෙම දිරි ගැන්වීමේ දීමනාව නොගෙවිය යුතුය.

04.3 සේවයේ ස්ථිර නොවූ නිලධාරීන්ට මෙම දීමනාව හිමි නොවේ.

04.4 1957.05.23 දිනැති අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය යටතේ රු. 500/- ක දීමනාවක් ලබා ඇති නිලධාරියෙකු ද නියමිත සුදුසුකම් සපුරා ඇත්නම් සිංහල භාෂාවට දිරිදීමනා ලැබීමට සුදුසුකම් ලබන අතර උක්ත චක්‍රලේඛයෙන් ලබාදී ඇති රු. 500/- ප්‍රසාද දීමනාව මෙම චක්‍රලේඛයේ විවිවිධාන ප්‍රකාරව හිමි ප්‍රසාද දීමනාවෙන් එකවර අඩු කළ යුතුය.

04.5 1988.02.11 දිනැති අංක 5/88 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ ගෙවන ලද රු. 500/- දීමනාව මෙම චක්‍රලේඛය යටතේ ගෙවනුලබන දීමනාවෙන් එකවර අඩු කළ යුතුය.

04.6 භාෂා ප්‍රවීණතාවය සඳහා දිරිගැන්වීමේ ක්‍රම හඳුන්වා දෙන ලද 1989.07.03 හා අංක 38/89, 1990.0312 දතම දරණ 38/89(I), 1991.04.24 දිනැති අංක 38/89(II) හා 1995.10.09 දිනැති අංක 38/89(III) චක්‍රලේඛ යටතේ නිලධාරීන්ට එක් වරක් පමණක් ගෙවන ලද ප්‍රසාද මුදල් දීමනාව මෙම චක්‍රලේඛය යටතේ ගෙවනු ලබන ප්‍රසාද දීමනාවෙන් එකවර අඩු කළ යුතුය.

04.7 යම් සීමිත කුසලතා පරීක්ෂණ මගින් සේවාවකට ඇතුලත් වන නිලධාරීන්ට නියමිත භාෂා ප්‍රවීණතාවය වන්නේ විවෘත තරඟ විභාගයකින් සේවාවට ඇතුලත් වන නිලධාරීන්ට අදාල ප්‍රවීණතාව මට්ටම වේ.

04.8 දිරි දීමනා ලබා ගන්නා නිලධාරීන්, රජයට අවශ්‍ය වන විට තමන් ප්‍රවීණතාව දක්වන දෙවන හෝ තෙවන භාෂාව හෝ ඒ දෙකෙන්ම සිය සේවාව අමතර දීමනාවකින් තොරව රජයට සැපයීමට බැඳී සිටී. එසේ අපොහොසත් නිලධාරීන්ගේ දිරි දීමනා නතර කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට බලය ඇත.

## 05. <u>වෙනත් කරුණු</u>

05.1 මෙම ක්‍රමය යටතේ ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුප් රහිත විශේෂ දීමනාව පෞද්ගලික ලිපිගොනු ලෙජර හා වැටුප් පත්‍රිකාවක් වැනි රාජකාරී ලේඛණවල වෙත වෙනම පෙන්නුම් කළ යුතුය.

05.2 මෙම චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනිව යම් ගෙවීමක් කර ඇත්නම් එය ආපසු අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

05.3 මෙම චක්‍රලේඛයෝ සඳහන් පරිදි ගෙවීම් කිරීමේදී හෝ නොකිරීමේදී මතයක් ප්‍රකාශ කළහොත් ඒ පිළිබඳව ආයතන අධ්‍යක්ෂ වෙත කරුණු ඉදිරිපත් කර ඔහුගේ එකඟත්වය ඇතිව තීරණයක් ගත යුතුය.

අ.කලේ/(ඩික්සන් නිලවීර)
වැඩ බලන ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය